# ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

## වාර්ෂික වාර්තාව 2011

223 සී, නාවල පාර,
නාරාහේන්පිට, කොළඹ 5

දුරකථන:011-2807945, 2808947, 2807346
ෆැක්ස්:011-2807347

විද්‍යුත් තැපැල:nastecsl@yahoo.com
වෙබ් අඩවිය:www.nastec.lk

**වාර්ෂික වාර්තාව 2011**

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ ප්‍රකාශණයකි**

**සංස්කරණය : ආචාර්ය මුදිත ලියනගෙදර.**

**සම්පාදනය : නිල්මිණී පෙරේරා මහත්මිය.**

**සැප්තැම්බර් 2012**

# පටුන


අප ගැන............................................................ 05

අධ්‍යක්ෂතුමාගේ ප්‍රකාශය .............................................. 06

කොමිෂන් සභා සාමාජිකයින් .......................................... 07

ආයතනික ආකෘතිය.................................................... 09

ක්‍රියාකාරකම් : විද්‍යා හා තාක්ෂණ සමාලෝචනය...................... 10

: විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම.............. 11

: ද්විවාර්ෂික විද්‍යා හා තාක්ෂණ සම්මන්ත්‍රණය ........... 12

: අධ්‍යයන කණ්ඩායම් ..................................... 12

:ජාතික විද්‍යා හා තාක්ෂණ සමාලෝචනය.................. 12

: තරුණ විද්‍යාඥ සංසදය .................................... 13

: අධ්‍යක්ෂ සංසදය ........................................ 15

: අනෙකුත් ක්‍රියාකාරකම්.................................... 16

ජාත්‍යන්තර සබඳතා.................................................... 17

අපගේ කාර්යය මණ්ඩලය............................................... 19

කාර්යය මණ්ඩල පුවත් ............................................... 20

මූල්‍ය ප්‍රකාශනය ........................................................ 22

විගණකාධිපති වාර්තාව............................................... 24

සම්බන්ධීකරණ දත්ත ................................................ 37

## අප ගැන

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (නස්ටෙක්) 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ පනත මගින් ස්ථාපිත කළ ආයතනයක් වන අතර 1998 අගෝස්තු මාසයේදී එය ක්‍රියාත්මක වීම ඇරඹින. 1998 දෙසැම්බර් 06 දින නිල වශයෙන් ආරම්භ කළ අතර පූර්ණ ක්‍රියාකාරී ආයතනයක් බවට පත්වූයේ 1999 ජනවාරි මස සිටය. ශ්‍රී ලංකා රජයට විද්‍යා හා තාක්ෂණ කරුණු සම්බන්ධව උපදෙස් ලබාදීම හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වූ ඉහළම ආයතනය වශයෙන් නස්ටෙක් ආයතනය නම් කරන ලදී. කොමිෂම සාමජිකයන් සත් දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් පත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමන් විසිනි.

**අපගේ දැක්ම**

"ශ්‍රී ලාංකීය ජනතාවගේ සමෘද්ධිය හා සෞභාග්‍ය ඉහල නැංවීම උදෙසා විද්‍යාවේ හා තාක්ෂණයේ විභවය හා භාවිතය පිළිබඳ රජයට උපදෙස් සපයන විශිෂ්ඨ ආයතනයක් වීම"

**අපගේ මෙහෙවර**

"තිරසාර සංවර්ධනය සඳහා යොදා ගැනීම උදෙසා විද්‍යා හා තාක්ෂණ ජාතික හැකියාවන් ගොඩනැංවීම සඳහා රජයට ප්‍රතිපත්ති, උපායමාර්ග සහ සැලසුම් ඉදිරිපත්කිරීම "

# අධ්‍යක්ෂතුමාගේ ප්‍රකාශය



ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා රජයට සහ රටේ විද්‍යාත්මක ප්‍රජාව වෙත ඉතා සතුටින් පිළිගන්වමි.අප්‍රමාණවත් විද්‍යාත්මක කාර්යය මණ්ඩලය හා එක්ව නස්ටෙක් ආයතනය 2011 වර්ෂය තුලදීද එහි අපේක්ෂිත ප්‍රතිදානයන් ලබාදීම සඳහා අරගලයක යෙදීමට සිදුවුනි.එම නිසා දැනට සිටින කාර්යය මණ්ඩලය සමගින් ප්‍රතිදානය උපරිම කර ගැනීමට සමහර අනිවාර්ය කාර්යන් හි පරිමාව අඩු කිරීමට සිදු විය .

මෙම වර්ෂයේදී අවධාරණය ලැබුනේ නස්ටෙක් ආයතනයේ සමාලෝචන විධිනියෝගයටය. ආයතන දෙකක , එනම් පරමාණුක ශක්ති අධිකාරියේ සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ සමාලෝචනයන් සම්පූර්ණ කරන ලදී. මෙම වර්ෂයේදී තවත් ආයතන දෙකක් සමාලෝචනය කිරීමට නියමිතව තිබුණද ඒවායේ ස්වයං අධ්‍යන වාර්තා ප්‍රමාද වීම නිසා 2011 වර්ෂය තුළදී ඒවා සමාලෝචනය කිරීමට නොහැකි විය. වාර්ෂික ජාතික විද්‍යා හා තාක්ෂණ සමාලෝචනය සඳහා දත්ත එකතු කිරීමට උචිත ලේඛනයක් සම්පාදනය කල අතර දත්ත එකතු කිරීම සිදුවෙමින් පැවතුණි. මෙම වර්ෂයේ පළමු කාර්තුවේදී පසුගිය වර්ෂයේ දත්ත එකතු කිරීම ප්‍රයෝගිකව අපහසු කාර්යයක් බව පෙනී ගිය අතර සමාලෝචන වාර්තාව නියමිත කාලයට බාර දීමට එය බලපානු ඇත.

සත්වන විද්‍යා හා තාක්ෂණ ද්විවාර්ෂික සමුළුව සඳහා වූ මූලික කාර්යයන් වසරේ පසු භාගයේදී සිදු වෙමින් පැවතුණි.සත්වන විද්‍යා හා තාක්ෂණ ද්විවාර්ෂික සමුළුව සඳහා කාලෝචිත තේමාවක් තෝරාගැනීමේ දී කොමිසමේ ප්‍රධාන උපදේශණ ශාඛාවේ එනම් අධ්‍යක්ෂක සංසදයේ අදහස් සහ උපදෙස් ද ලබා ගන්නා ලදී. කුසලතා සංවර්ධන වැඩමුළු, තරුණ විද්‍යාඥ සංසදයේ සම්මාන ප්‍රධානය,වාර්ෂික මහා සභා රැස්වීම හා සමගාමීව පර්යේෂණ සම්මන්ත්‍රණය වැනි තරුණ විද්‍යාඥ සංසදයේ සුපුරුදු ක්‍රියාකාරකම් කොමිෂම මෙම වර්ෂයේදීද සිදු කළේය.

මෙම වර්ෂයේ දී නාම් විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ (NAM S&T Center) සහ බිම්ස්ටෙක් (BIMSTEC) හි කාර්යන් වලට අමතරව නස්ටෙක් ආයතනය ජපානයේ විද්‍යා කවුන්සලය (SCJ) සම- කටයුතු කළේය. ආසියානු විද්‍යා කවුන්සලය හා සම්බන්ධ වන ලෙස ජපන් විද්‍යා කවුන්සලය නස්ටෙක් ආයතනයට ආරධනා කළේය.

නස්ටෙක් ආයතනය ඵලදායී ලෙස ක්‍රියාත්මක වීමට ඇති ප්‍රධාන අවහිරතාව වන්නේ පසු ගිය වසර දෙකේ සිට ප්‍රමාණවත් විද්‍යාත්මක කාර්යය මණ්ඩලයක් නොමැතිවීම දිග්ගැස්සී යාමයි. මෙහිදී නව බඳවා ගැනීමේ පරිපාටියේ ඇති කොන්දේසි වලට අනුව, නව බඳවා ගැනීම් සහ පුරප්පාඩු පිරවීම් අවහිර කරන බව පෙනී ගොස් ඇති අතර මෙය ආයතනවල කාර්යය සාධනයට බලපා ඇත. මෙම තත්වය යටතේ අධ්‍යක්ෂක වරුන් වැනි ජ්‍යේෂ්ඨ නිළධාරීන්ට එදිනෙදා පුරුදු කාර්යයන් හි නියැලීමට සිදුවී ඇති අතර ආයතනයේ කාර්යයන් අධීක්ෂණයට සහ ම- පෙන්වීමටත් නව අදහස් සහ නව කාර්යයන් ඉටු කිරීමටත් ඔවුන්ට කාලයක් නොමැත.කාර්යක්ෂම විද්‍යා හා තාක්ෂණ පද්ධතියක් දැකීමට අවශ්‍ය නම් වගකිව යුතු බලධාරීන් මෙම අමිහිරි යථාර්තය තෙරුම් ගත යුතුයි.

කාර්යය මණ්ඩල හිඟය නිසා ඇතිවන අපහසුතා මධ්‍යයේ නස්ටෙක් ආයතනයේ කාර්යයන් සම්පූර්ණ කිරීම උදෙසා නස්ටෙක් කාර්යය මණ්ඩලයේ කැපවීමට ස්තුති කිරීම සඳහා මා මෙය අවස්ථාවක් කර ගනිමි.

ස්තුතියි

**ආචාර්ය මුදිත ලියනගෙදර**
**වැඩ බලන අධ්‍යක්ෂ**

# කොමිෂන් සභා සාමාජිකයින්

**මහාචාර්ය නාලිනී බී. රත්නසිරි.**
**සභාපතිනිය**



කීට විද්‍යාඥ: සත්ව විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය; කීට විද්‍යා පර්යේෂණ නිළධාරිනී,කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (1966-1974); කීට විද්‍යා පර්යේෂණ නිළධාරිනී, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව (1974-1983); සත්ව විද්‍යාව පිලිබඳ මහාචාර්ය (1983-1986); ප්‍රාරම්භක පීඨාධිපති ,ස්වභාවික විද්‍යා පීඨය (1986-1992) සහ සත්ව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (1986-2005), ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය; සාමාජික සහ උප සභාපතිනි, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (1993-1994); සභාපතිනි, ජාතික මෙහෙයුම් කමිටුව, GEF/UNDP සුළු ආධාර වැඩසටහන් සාමාජික, ජාතික මෙහෙයුම් කමිටුව, EU/UNDP නිවර්තන කලාපීය වනාන්තර ප්‍රවර්ධන වැඩසටහන; විශ්ව විද්‍යාල අධ්‍යාපනය පිලිබඳ නිත්‍ය කමිටුව, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව; සාමාජික, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (2003 සිට මේ දක්වා); සභාපතිනි, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (2005 සිට මේ දක්වා)

**විද්‍යාජෝති මහාචාර්ය කේ.කේ.වයි.ඩබ්. පෙරේරා**



ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු විද්‍යා මහාචාර්ය: සභාපති, නවීන තාක්ෂණය පිලිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය; නිර්මාතෘ හා සභාපති, NERD ආයතනය (1974-1977); සභාපති, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය(1977-1989); ලේකම්, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය (1981_1990) සහ (2001-2003); සභාපති, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (1985-1996); ගරු මහාචාර්ය, මොරටුව විශ්ව විද්‍යාලය; අධ්‍යක්ෂක, ADB පිරිස් සංවර්ධන ව්‍යාපෘතිය (1997-2001)

**මහාචාර්ය එච්.පී.එම්. ගුණසේන**



ශෂ්‍යවිද්‍යාඥ: භෝග විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය,පේරාදේණිය විශ්ව විද්‍යාලය සහ විධායක අධ්‍යක්ෂ, කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති කවුන්සලය; භෝග විද්‍යා මහාචාර්ය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය (1982); පීඨාධිපති, කෘෂි විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය ,(1982-1994); අධ්‍යක්ෂ, වයඹ විශ්ව විද්‍යාලය (1996-1998); අධ්‍යක්ෂ, කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (1972 - 2002); සාමාජික විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (1999-2005);

**ආචාර්ය සී.ටී.එස්. බී.පෙරේරා**



කර්මාන්ත විශේෂඥ: කළමනාකාර අධ්‍යක්ෂ, සැම්සන් රජරට ටයිල්ස් පුද්ගලික සමාගම; අධ්‍යක්ෂ, සීමාසහිත කැළණි කේබල්ස් සමාගම; අධ්‍යක්ෂ, සීමාසහිත පිරමල් වීදුරු [සිලෝන්] සමාගම; අධ්‍යක්ෂ, සීමාසහිත දන්කොටුව පෝසිලේන් සමාගම, උප සභාපති, මහජන උපයෝගීතා කොමිෂන් සභාව; මාණ්ඩලික සාමාජික CRIB; අධ්‍යක්ෂ, ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව

**වෛද්‍ය පාලිත අබේකෝන්**




වෛද්‍ය පාලිත අබේකෝන්. ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යේෂ්ඨ උපදේශක; හිටපු සභාපති, සෞඛ්‍ය පද්ධති සංවර්ධනය හා සෞඛ්‍ය තාක්ෂණය (WHO), අග්නිදිග ආසියානු කලාපය; ජ්‍යේෂ්ඨ ටකෙමි අධිශිෂ්‍යත්වලාභී, හා(ර්)වඩ් විශ්ව විද්‍යාලය; සාමාජික, අන්තර්ජාතික රෝග සායනික ජාලයෙහි අධ්‍යක්ෂක මණ්ඩලය, අග්නිදිග ආසියාතික වෛද්‍ය අධ්‍යාපන සංගමය සහ අග්නිදිග ආසියානු මහජන සෞඛ්‍ය අධ්‍යාපන ජාලය (WHO); ශ්‍රී ලංකා ඒඩ්ස් පදනමේ සභාපති.

**මහාචාර්ය ඩබ්.ඩී. ලක්ෂ්මන්**



ආර්ථික විද්‍යාඥ: කොළඹ විශ්ව විද්‍යාලය; සභාපති, සමාජ විද්‍යාඥ සංගමය (1986-1988,1994); සභාපති, ශ්‍රී ලංකා ආර්ථික විද්‍යාඥයන්ගේ සංගමය (1990-1993); පීඨාධිපති, උපාධි අධ්‍යයන පීඨය (1992-1994), ශ්‍රී ලංකා පදනම් ආයතනය (1995-1997) උපකුලපති (1994-1999) සභාපති, කළමනාකරණ කවුන්සලය, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය. උප සභාපති, ජාතික සංවර්ධන කවුන්සලය; මණ්ඩල සාමාජික, නරේසා(1997-1998) බාහිර මහාචාර්ය, ර්යුකොකු විශ්ව විද්‍යාලය ජපානය(1999-2001); ආර්ථික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කොළඹ විශ්ව විද්‍යාලය; ආර්ථික විද්‍යා මහාචාර්ය, සාගා විශ්ව විද්‍යාලය, ජපානය (2004-2005);

# ආයතනික ව්‍යුහය




තනි ඉරි [ _ ] වලින් දැක්වෙන්නේ ස්ථිර තනතුරුය

කඩ ඉරි [ --- ] වලින් දැක්වෙන්නේ තාවකාලික තනතුරුය

# අපගේ ක්‍රියාකාරකම්

## - විද්‍යා හා තාක්ෂණ ආයතන සමාලෝචනය

විද්‍යා හා තාක්ෂණ ආයතන සමාලෝචනය ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ අනිවාර්ය කාර්යයකි. මෙම ආයතනික සමාලෝචන සිදු කරනු ලබන්නේ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් සම්පාදනය කළ සමාලෝචන කාර්යය පටිපාටිය අනුවය. මෙම සමාලෝචනය මගින් ආයතන වල කාර්ය සාධනය සහ කළමනාකාරිත්වය යන අංශ දෙකම ආවරණය කරනු ලබයි. සමාලෝචන ක්‍රියාවලිය ආරම්භ වන්නේ සමාලෝචනය කිරීමට නියමිත ආයතනයට ස්වයං ඇගයීම් වාර්තාක් ලබා දෙන ලෙස කරන්නා වූ ඉල්ලීමත් සමගය. එම ස්වයං ඇගයීම් වාර්තාව කොමිෂමට ලැබීමෙන් අනතුරුව කොමිෂම සමාලෝචන මණ්ඩලයක් පත් කරන අතර එය ස්වයං ඇගයීම් වාර්තාව පදනම් කරගෙන සමාලෝචනය සිදු කරනු ලබයි.

2011 වර්ෂයේදී සමාලෝචනය කිරීම සඳහා සැලසුම් කරන ලද ආයතන වූයේ පරමාණුක ශක්ති අධිකාරිය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, කාර්මික තාක්ෂණ ආයතනය සහ නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය යන ආයතනයන්ය. මෙම ආයතන 4 අතුරින් ආයතන දෙකක, එනම් පරමාණුක ශක්ති අධිකාරිය සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය යන ආයතනවල සමාලෝචනයන් සම්පූර්ණ කරන ලදී. විවිධ හේතූන් නිසා අනෙක් ආයතන දෙකෙහි ස්වයං ඇගයීම් වාර්තා ප්‍රමාද වීම හේතුවෙන් එවායේ සමාලෝචනයන් කල් දමන ලදී. කෙසේ වෙතත් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය සිය ස්වයං ඇගයීම් වාර්තාව 2011 දෙසැම්බර් මාසයේදී බාර දෙන ලදී.

මේ අතරතුර කාලයේදී 2010 වර්ෂයේදී සමාලෝචනය කරන ලද පොල් පර්යේෂණ ආයතනයේ සමාලෝචන වාර්තාව එහි අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළිගන්නා ලදී.

<u>පරමාණුක ශක්ති අධිකාරියේ සමාලෝචනය (AEA)</u>

2010 වර්ෂය අවසානයේදී ස්වයං ඇගයීම් වාර්තාව ලැබීමෙන් අනතුරුව ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් පරමාණුක ශක්ති අධිකාරියේ එක- ත්වයද ඇතිව පහත සමාලෝචන කණ්ඩායම පත් කරන ලදී.

- මහාචාර්ය ඉන්ද්‍රා දයාවංශ (සභාපතිනි)
  විදුලිත් හා සන්නිවේදන ඉංජිනේරු දෙපාර්තමේන්තුව.
  ඉංජිනේරු පීඨය.
  මොරටුව විශ්ව විද්‍යාලය

- ආචාර්ය ආර්.ඩී. ගුණරත්න
  රසායන විද්‍යා දෙපාර්තමේන්තුව
  විද්‍යා පීඨය
  කොළඹ විශ්ව විද්‍යාලය

- මහාචාර්ය සිවලී රණවන - පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය (විශ්‍රාමික)

- ඒ. පන්නිල මහතා- තාක්ෂණ සේවා දෙපාර්තමේන්තුව, කාර්මික තාක්ෂණ ආයතනය

සමාලෝචනය සැලසුම් කිරීම සඳහා පරමාණුක ශක්ති අධිකාරියේ අධ්‍යක්ෂක වරයා සම- 2010.12.06 වන දින ප්‍රථම රැස්වීම පවත්වන ලදී. සමාලෝචන කමිටුව පරමාණුක ශක්ති අධිකාරියට ගොස් 2010 ජනවාරි 27 සහ පෙබරවාරි 15 යන දෙදින තුල සමාලෝචන කටයුතු සිදු කරන ලදී. සමාලෝචනය පූර්ණ සහ සමතුලිත සමාලෝචනයක් කිරීම සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් පරමාණුක ශක්ති අධිකාරියේ සේවාලාභීන්ගේ රැස්වීමක් 2011.03.11 දින සංවිධානය කරන ලදී. මෙය සංවිධානය කරන ලද්දේ පරමාණුක ශක්ති අධිකාරියෙන් සැපයෙන සේවාවන් පිළිබඳව ඔවුන්ගේ අදහස් සහ ගුණදොස් ලබාගැනීම සඳහාය.

ඉන් අනතුරුව ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී සමාලෝචන කමිටුවේ රැස්වීම් කිහිපයක් පැවැත්වුණු අතර ප්‍රථම සමාලෝචන වාර්තාව 2011 අගෝස්තු 3 වන දින පරමාණුක ශක්ති අධිකාරිය

වෙත යොමු කරන ලදී. සමාලෝචන කමිටුව පරමාණුක ශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ තුමා සහ එහි ජ්‍යෙෂ්ඨ කාර්යය මණ්ඩලය සමඟ සමාලෝචන වාර්තාව පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අවසාන රැස්වීම 2011 ඔක්තෝබර් මස 13 වන දින පවත්වන ලදී. අවසාන සමාලෝචන වාර්තාව මහාචාර්ය ඉන්ද්‍රා දයාවංශ විසින් 2011 වර්ෂයේ නොවැම්බර් මස කොමිෂමට ඉදිරිපත් කල අතර ඒ සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබුණි.

**<u>ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ සමාලෝචනය (NBRO)</u>**

2011 වසරේ ජුනි මාසයේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ස්වයං ඇගයීම් වාර්තාව ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවට ලැබුනු අතර ප්‍රථම සමාලෝචන මණ්ඩල රැස්වීම 2011 ජුලි මස 25 දින පවත්වන ලදී. මෙම සමාලෝචන මණ්ඩලය සමන්විත වූයේ, මහාචාර්ය ශාන්ත කේ.හෙන්නායක (සභාපති ), භූ ගෝල විද්‍යා දෙපාර්තමේන්තුව, කලා පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය; මහාචාර්ය හර්ෂ මුණසිංහ, වාස්තු විද්‍යා දෙපාර්තමේන්තුව, වාස්තු විද්‍යා පීඨය, මොරටුව විශ්ව විද්‍යාලය; ආචාර්ය ජයලත් එදිරිසිංහ, සිවිල් ඉංජිනේරුදෙපාර්තමේන්තුව, ඉංජිනේරු පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය; ආචාර්ය ජගත් ගුණතිලක, භූ විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යා පීඨය පේරාදෙණිය විශ්ව විද්‍යාලය, යන අයගෙනි.

සමාලෝචන මණ්ඩලයේ ප්‍රථම රැස්වීම ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අධ්‍යක්ෂ ආචාර්ය ආසිරි කරුණාවර්ධන මහතා සහ ජ්‍යෙෂ්ඨ නිළධාරීන් සම- අගොස්තු මස 3 දින පැවැත්විණි. ඉන් අනතුරුව 2011 අගෝස්තු 23 සිට 25 දක්වා දිනයන්හිදී සමාලෝචනය පැවැත්විණි. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ සේවාලාභින් සමග රැස්වීම ඔවුන්ගේ අදහස් සහ මතවාද ලබාගැනීම සඳහා අගෝස්තු මස 24 වන දින ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී පැවැත්විණි. වසරේ අවසානය වන විට සමාලෝචන වාර්තාව සැකසෙමින් තිබුණි.

## - ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කිරීම

2008 වර්ෂයේදී ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් සම්පාදනය කරන ලද ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය සඳහා 2009 වර්ෂයේදී කැබිනට් අනුමැතිය ලැබුණි. ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමත් සම- ඒ සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කිරීමට විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව උත්සාහ දරන ලදී. මෙහි ප්‍රථම ප්‍රයත්නය වූයේ 2010 වර්ෂයේදී පවත්වන ලද සයවන විද්‍යා හා තාක්ෂණ ද්වි වාර්ෂික සමුළුවයි. එහිදී ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අන්තර්කාලීන උපාය මාර්ගයක් ලෙස ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මක් සාකච්ඡාවට ලක් කරන ලදී. මෙම ක්‍රියාකාරී සැලැස්ම තුලින් මූලික වශයෙන් සිදු වූයේ රටේ විද්‍යා හා තාක්ෂණ ආයතනවල ක්‍රියාකාරකම් සම- විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තියේ දක්වා ඇති මූලාරම්භයන් ගැලපීමයි. කෙසේවෙතත් මෙය විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය යම් පමණකට ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් සෑහේ.

අන්තර්කාලීන සැලැස්මේ අප්‍රමාණවත් බව සලකා බලා පුළුල් ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කිරීම මෙම වර්ෂයේ දී ආරම්භ කරන ලදී. ප්‍රතිපත්තියෙහි ඇති මූලාරම්භයන් ක්‍රියාත්මක කිරීම සඳහා රටේ විද්‍යා හා තාක්ෂණ ආයතන වලට කළ හැකි ක්‍රියාකාරකම් ලැයිස්තු ගතකරන ලෙස ඔවුන් ගෙන් ඉල්ලා සිටින ලදී. මෙම තොරතුරු ලබා ගැනීම උදෙසා සියළුම විද්‍යා හා තාක්ෂණ ආයතන වෙත යැවීම සඳහා ප්‍රතිපත්ති මූලාරම්භයන් සහිත ක්‍රියාකාරී සැලැස්මක ආකෘතියක් පිළියෙල කරන ලදී.

මෙම ඒකාබද්ධ ආයතනික ක්‍රියාකාරී සැලැස්ම ජුනි මස පවත්වන ලද අධ්‍යක්ෂ සංසදයේ රැස්වීමකදී සාකච්ඡාවට භාජනය විය. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සඳහා කොමිෂන් සභාව සමග කටයුතු කිරීමට සම්බන්ධිකරණ නිලධාරීන් පත් කරන ලෙස අදාළ ආයතන වලින් ඉල්ලා සිටින ලදී.

## – BICOST - VII

- **ශ්‍රී ලංකා ද්විවාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව**

**සත්වන ද්විවාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුවේ පෙර ක්‍රියාකාරකම්**

මීළ- ද්විවාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුවේ තේමාව, අන්තර්ගතය සහ අපේක්ෂිත ප්‍රතිඵල පිළිබඳව වසරේ පසු භාගයේදී විස්තරාත්මකව සාකච්ඡා කරන ලදී. මේ සම්බන්ධව විද්‍යා හා තාක්ෂණ ආයතන වල අධ්‍යක්ෂක වරුන්ගේ අදහස්ද විමසා බලන ලදී.

සමුළුව සඳහා අනුමාන මාතෘකා කීපයක් යෝජනා කෙරුනු අතර ඒවා සාකච්ඡාවටද භාජනය විය. "පර්යේෂණාත්මක සොයාගැනීම් වාණිජ්‍යකරණය" යන්න සමුළුවේ පෘථුල තේමාව විය යුතු බවට එක- තාවයකට එළඹිණි. කොමිෂම පහත සඳහන් විශේෂිත තේමාවන් යෝජනා කළ අතර ඒවා දීර්ඝ වශයෙන් සාකච්ජාවට භාජනය විය.

- බල ශක්ති පර්යේෂණ අවශ්‍යතා ද ඇතුලත්ව කර්මාන්ත අංශයේ පර්යේෂණ අවශ්‍යතා හඳුනා ගැනීම සහ රජයේ පර්යේෂණ හා සංවර්ධන ආයතන තුළින් එම අවශ්‍යතා සපුරාලීම

- කර්මාන්ත අංශයේ සහයෝගිතාවය ඇතිව රජයේ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම

සත් වන ද්විවාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුවේ ප්‍රධාන මෙහෙයුම් කමිටුවේ සහ කාරක සභාවල සංයුතිය පිළිබඳ සාකච්ඡා වෙමින් පැවතිණි. ගරු තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමියගේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කිරීමට ඉහත සාකච්ජාව මත පදනම්ව සංකල්ප පත්‍රිකාවක් පිළියෙල කිරීමට නියමිතය.

## – අධ්‍යයන කණ්ඩායම්

- **විද්‍යාව හා තාක්ෂණය සඳහා වූ මානව සම්පත් සංවර්ධනය කිරීමේ විශේෂඥ අධ්‍යයන කණ්ඩායම**

වර්තමාන මානව සම්පත් දත්ත එකතු කිරීම සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් මෙහෙයවන ලද සමීක්ෂණයට ප්‍රතිචාර වශයෙන් විද්‍යා හා තාක්ෂණ ආයතන 28 ක් දත්ත ලබාදුන් අතර ඒවා විශ්ලේෂණය කොට අධ්‍යයන කණ්ඩායම වෙත ඉදිරිපත් කරන ලදී. එකතු කරන ලද දත්ත මත පදනම්ව වාර්තාවක් සකස් කළ අතර ඒ සමගින් විද්‍යා හා තාක්ෂණ අංශයේ මානව සම්පත් තත්ව සමාලෝචනය සම්පූර්ණ විය.

## ජාතික විද්‍යා හා තාක්ෂණ සමාලෝචනය

- **වාර්ෂික ජාතික විද්‍යා හා තාක්ෂණ සමාලෝචනය** 2009-2010

වාර්ෂික ජාතික විද්‍යා හා තාක්ෂණ සමාලෝචනය සඳහා පිළියෙල කරන ලද දත්ත එකතු කිරීමේ ආකෘති පත්‍රය සංශෝධනය කර, සමාලෝචනය සඳහා දත්ත සහ තොරතුරු එකතු කිරීම සඳහා සියලුම විද්‍යා හා තාක්ෂණ ආයතන වලට යවන ලදී. සමාලෝචනය සඳහා දත්ත එකතු කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා ජ්‍යේෂ්ඨ නිළධාරියෙක් පත් කරන ලෙස එක් එක් විද්‍යා හා තාක්ෂණ ආයතනය වෙතින් ඉල්ලා සිටින ලදී. මෙමගින් දත්ත එකතු කිරීමේ ක්‍රියා පිළිවෙල අනුකූලනය වන අතර සම්පූර්ණ කරන ලද දත්ත රැස් කිරීමේ ආකෘති පත්‍ර නියමිත වෙලාවට නස්ටෙක් ආයතනයට බාර දීම මෙම නිළධාරීන්ගේ වගකීමකි. අපගේ ඉල්ලීමට ප්‍රතිචාර ලෙස බොහෝ ආයතන සම්බන්ධීකරණ නිළධාරීන් නම්කොට නස්ටෙක් වෙත දන්වා එවන ලදී. දත්ත එකතු කිරීමේ ආකෘති පත්‍රයේ අන්තර්ගතය සහ සමාලෝචනයේ ගැඹුර පැහැදිලි කිරීම සඳහා වන සම්බන්ධීකරණ නිළධාරීන්ගේ රැස්වීමක සංවිධාන කටයුතු වසර අවසාන වන විට සිදු වෙමින් පැවතිණි.

## - තරුණ විද්‍යාඥ සංසදයේ ක්‍රියාකාරකම්

### ♦ පුද්ගල සංවර්ධනය සඳහා අභිධාන නිර්මාණ වැඩමුළුව

(2011 ජුනි 24, විමල සුරේන්ද්‍ර ශ්‍රවණාගාරය, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය)

මෙම වැඩමුළුව ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ තරුණ විද්‍යාඥ සංසදයේ මූලාරම්භයකි. මෙම වැඩමුළුවෙහි සම්පත් දායිකාව වූයේ ශ්‍රී ලංකාවේ ඇමරිකානු මධ්‍යස්ථානයට අනුබද්ධිත එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ සේවය කරන, කුසලතා සංවර්ධන විශේෂඥ පෙප් ජැකීන්ස් මහත්මියයි. තරුණ විද්‍යාඥයින් 100ක් පමණ මෙම වැඩමුළුවට සහභාගී විය. ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය හරහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව ජැකීන්ස් මහත්මියට ආරාධනා කල අතර ඇය එහි උපාධි අපේක්ෂකයින්ගේ කුසලතා සංවර්ධනය සඳහා වූ තාවකාලික උපදේශණ කාර්යයක නියැලී සිටියාය.




පෙප් ජැකීන්ස් මහත්මිය ඇයගේ දේශනය ඉදිරිපත් කරමින්



සමුළුවට සහභාගීවූවන් ගෙන් කොටසක්

මෙම වැඩමුළුව සංවිධානය කිරිමේ අරමුණ වූයේ ස්වකීය සංවර්ධනය සඳහා තරුණ විද්‍යාඥයින්ට සහාය වීමයි. මෙහිදී සාකච්ඡා කල මාතෘකා වූයේ පුද්ගල සංවර්ධන සැලසුම් සකස් කිරීම, යමෙකු සතු ප්‍රභලතා විශ්ලේෂණය කිරීම, සහ වැඩි දියුණු කල යුතු ක්ෂෙත්‍ර හඳුනා ගැනීම, දිගුකාලින දැක්මක් හඳුනා ගැනීම, ස්වකීය දියුණුව සහ සෞඛ්‍ය, පවුල සහ මිතුරන් අතර සංතුලනතාවක් පවත්වා ගනිමින් අභිමතාර්ථ මුදුන්පත් කර ගැනීම උදෙසා උපාය මාර්ග සංවර්ධනයයි.

වැඩමුළුවේ දෙවන සැසිවාරයේදී සහභාගීවූවන් කණ්ඩායම් වලට බෙදා පොදු අභිධානයක් නිර්මාණය කරන ලෙස එක් එක් කණ්ඩායමෙන් ඉල්ලා සිටින ලදී. අවසානයේදී සියළුම කණ්ඩායම් සිය අභිධානයන් සභාවට ඉදිරිපත් කල අතර ජැකීන්ස් මහත්මිය ඒවා පිළිබඳ සිය අදහස් ඉදිරිපත් කළාය.

## ව්‍යාපෘති කළමණාකරණ මූලධර්ම පිළිබඳ වැඩමුළුව
### 2011 ඔක්තෝබර් 28, මහින්ද සිල්වා ශ්‍රවණාගාරය, හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂිකර්ම පර්යේෂණ හා පුහුණු ආයතනය

මෙය තරුණ විද්‍යාඥ සංසදයේ තවත් මුලාරම්භයකි. මෙම වැඩමුළුව මෙහෙය වනු ලැබුයේ වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමණාකරණ පීඨයේ මහාචාර්ය උදිත් කේ.ජයසිංහ මුදලිගේ (කෘෂි ආර්ථික හා ව්‍යාපාර කළමණාකරණ මහාචාර්ය) විසිනි.

ව්‍යාපෘති විෂය පථ කළමනාකරණය, ව්‍යාපෘතිය කාල සටහන් කළමනාකරණය, අය වැය කළමනාකරණය, තත්ව කළමනාකරණය, ව්‍යාපෘති කණ්ඩායම් කළමනාකරණය, තොරතුරු කළමනාකරණය, ව්‍යාපෘති ආපදා කළමනාකරණය, ව්‍යාපෘති පරදුදරන්නන් කළමනාකරණය සහ ව්‍යාපෘති අන්තර්ගතය කළමනාකරණයද ඇතුළුව ව්‍යාපෘති කළමනාකරණයෙහි සියළු ප්‍රධාන අංශ මෙහෙදී සාකච්ඡාවට භාජනය විය.



මහාචාර්ය උදිත් ජයසිංහ සිය දේශනය ඉදිරිපත් කරමින්



සමුළුවට සහභාගීවූවන් ගෙන් කොටසක්

විශ්ව විද්‍යාල හා පර්යේෂණ සහ සංවර්ධන ආයතන වලින් 100කට ආසන්න තරුණ විද්‍යාඥයින් පිරිසක් මෙම වැඩමුළුවට සහභාගී විය.

## තරුණ විද්‍යාඥ සංසදයේ සම්මාන ප්‍රධානය-2010

තරුණ විද්‍යාඥයින් දිරිමත් කිරීමට සහ ඔවුන්ගේ ජයග්‍රහනයන් අගය කිරීම උදෙසා තරුණ විද්‍යාඥ සම්මාන වාර්ෂිකව ප්‍රධානය කරනු ලබයි. විද්‍යාත්මක පර්යේෂණ සහ විද්‍යාව ජනප්‍රිය කිරීම හා ප්‍රවර්ධනය යන කාණ්ඩ දෙක යටතේ විශිෂ්ඨතාවන් සඳහා මෙම සම්මාන ප්‍රධානය කරනු ලබයි. තරුණ විද්‍යාඥ සංසද සාමාජිකයන් ගෙන් අයදුම්පත් කැඳවා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් පත් කරන ලද ජ්‍යේෂ්ඨ විද්‍යාඥ මණ්ඩලයක් මගින් 2006-2010 කාලය තුළ ඔවුන් සිදු කළ කාර්යයන් ඇගයීමට ලක් කරන ලදී. පහත සඳහන් තරුණ විද්‍යාඥයින් 2010 වර්ෂයේදී සම්මාන ලැබූහ.

- **විද්‍යාත්මක පර්යේෂණ විශිෂ්ඨත්වය සඳහා වූ තරුණ විද්‍යාඥ සම්මානය**

මෙම කාණ්ඩය යටතේ තරුණ විද්‍යාඥ සංසද සාමාජිකයන් හතර දෙනෙක් ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ලදී. විද්‍යාත්මක පර්යේෂණ කාණ්ඩය ඇගයීමේදී අයදුම්කරුවන් දෙදෙනෙකු සම විශිෂ්ඨතා පෙන්වා ඇති බව දක්නට ලැබුණි. එමනිසා මෙම කාණ්ඩය යටතේ පහත සඳහන් විද්‍යාඥයින් දෙදෙනාට සම්මාන දෙකක් ප්‍රධානය කිරීමට කොමිෂම තීරණය කරන ලදී.

1. ආචාර්ය රූපිකා එස්. රාජකරුණා,
සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව,
විද්‍යා පීඨය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය



2. මහාචාර්ය උදිත් ජයසිංහ,
කෘෂිකර්ම ව්‍යාපාර කළමණාකරණ දෙපාර්තමේන්තුව,
වගා කළමණාකරණ හා කෘෂිකර්ම පීඨය
ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය



- **<u>විද්‍යාව ජනප්‍රිය කිරීම හා ප්‍රවර්ධනය සඳහා වූ තරුණ විද්‍යාඥ සම්මානය</u>**

මේ යටතේ තරුණ විද්‍යාඥ සංසද සාමාජිකයන් දෙදෙනෙකු පමණක් අයදුම්කර තිබූ අතර ඇගයීම් මණ්ඩලය හඳුනාගත් පරිදි ඔවුන් කිසිවෙකුත් ඇගයුම් නිර්ණායක ප්‍රමිතීන් සපුරා නොතිබුණි. එම නිසා 2010 වර්ෂයේදී මෙම සම්මානය ප්‍රධානය නොකර සිටීමට තීරණය කරන ලදී.

## අධ්‍යක්ෂ සංසදයේ උපදෙස් ලබාගැනීම ( FOD)

ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ මීල- ද්විවාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව සඳහා තේමාවක් සාකච්ඡා කිරීම සඳහා අධ්‍යක්ෂ සංසදයේ රැස්වීමක් ජූනි 23 දින පවත්වන ලදී.

විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය විද්‍යා හා තාක්ෂණ ආයතන වල ත්‍රෛමාසික ප්‍රගති වාර්තා භාවිත කරමින් කල හැකි බව යෝජනා විය. මෙය ක්‍රියාත්මක කිරීමේ හැකියාව නිසි කලට මානව හා මූල්‍ය සම්පත් ලැබීම මත රඳා පවතින බවද ඉස්මතු කොට දක්වන ලදී. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව සහ ආයතන අතර ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සඳහා සම්බන්ධීකරණ නිළධාරීන් පත්කිරීමට අධ්‍යක්ෂ වරුන් එක- විය.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව මීල- ද්විවාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව සඳහා "පර්යේෂණාත්මක සොයාගැනීම් වාණිජ්‍යකරණය" යන පුළුල් තේමාව යෝජනා කලේය. සංසදය වාණිජ්‍යකරණයේ විවිධ පැතිකඩයන්ට අදාල තේමාවන් කීපයක් යෝජනා කලේය. ඒවා නම්,

- කර්මාන්තවල පර්යේෂණ අවශ්‍යතා හඳුනා ගැනීම,
- ආයතනවල පර්යේෂණ හා සංවර්ධන සේවාවන් ජාතික ආර්ථිකය කෙරෙහි ඇති කරන බලපෑම්,
- තත්වයෙන් උසස් නිෂ්පාදන හා සේවා සඳහා ජාතික තත්ව යටිතල පහසුකම්.

තේමාවේ විෂයට අදාල ගැටළු හා බාධක හඳුනා ගැනීමට අවස්ථා විශ්ලේෂණයක් සමුළුවට පෙර සිදුකල යුතු බවට යෝජනා විය.

මීට අමතරව විද්‍යා හා තාක්ෂණ ආයතන මුහුනපාන පොදු ගැටළු එනම්, මනා සුදුසුකම්ලත් මානව සම්පත් සහ මූල්‍ය සම්පත් හිඟය, ප්‍රමාණවත් පහසුකම් සහ වරප්‍රසාද නොමැති වීම නිසා සිදුවන බුද්ධි ගලනය පිළිබඳවද මෙම රැස්වීමේදී තව දුරටත් සාකච්ඡා කරන ලදී.

## – වෙනත් ක්‍රියාකාරකම්

### ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂමේ නව බඳවා ගැනීමේ පරිපාටි

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ තනතුරු සඳහා නව බඳවා ගැනීමේ පරිපාටි සකස් කිරීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේක අංක 30 ට අනුව අනිවාර්ය අවශ්‍යතාවයකි. මෙම පරිපාටිසැකසීම 2008 වසරේ සිට සිදුවෙමින් පැවතින. නව පරිපාටියේ කෙටුම්පත් කීපයක්ම සකස් කල අතර ඒවා පිලිබඳ වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කරන ලදී. මෙම දීර්ඝ ක්‍රියාවලිය අවසානයේදී මෙම පරිපාටීන් සඳහා 2011 සැප්තැම්බර් මාසයේදී අනුමැතිය ලැබුනි. වසර අවසාන වනවිට වර්තමාන සේවක මණ්ඩලය මෙම නව පරිපාටියට අන්තර්ග්‍රහනය කරමින් පැවතුනි.

### පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවට (CoPE) වාර්තා කිරීම

2011 මාර්තු 22 දින පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කමිටුව (CoPE) ඉදිරියේ පෙනී සිටින ලෙස කොමිෂමෙන් ඉල්ලා සිටියේය. ඉල්ලා සිටින ලද ලියකියවිලි සකසා පෙබරවාරි මාසයේදී CoPE කමිටුවට බාර දෙන ලදී. කොමිෂමේ අනිවාර්ය කාර්යයන් මෙහිදී සාකච්ඡාවට භාජනය විය. ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය මෙම සාකච්ඡාවෙහි තවත් එක් මාතෘකාවක් විය. මෙම රැස්වීමේදී කොමිෂම එහි කාර්යයන් කාර්යක්ෂම ලෙස සිදු කිරීමට ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැති වීම ඉස්මතු කර දැක්විය.

### ජපාන විද්‍යා කවුන්සලයේ නියෝජිතයන්ගේ ශ්‍රී ලංකා සංචාරය

මහාචාර්ය කනසාව, (දකුන) සහ මහාචාර්ය. ශිරාටා (වම) නස්ටෙක් නියෝජිතයන් සම-

ජපන් විද්‍යා කවුන්සිලය නියෝජනය කරමින් ජපාන නියොජිතයන් කණ්ඩායමක් 2011 වර්ෂයෙ අප්‍රේල් 26 වනදා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවට පැමිණියේය. මහාචාර්ය ඉචිරෝ කනසාව (ජපන් විද්‍යා කවුන්සිලයේ සභාපති), මහාචාර්ය සින්ඩි ශිරාටා සහ ජපාන කැබිනට් කාර්යාලයේ උප නියෝජිතයෙක් එම පිරිසට ඇතුලත් වූහ. මෙම සංචාරයේ අරමුණ වූයේ ආසියාතු විද්‍යා කවුන්සිලය ශ්‍රී ලංකාවට හඳුන්වා දීම සහ ප්‍රවර්ධනය කිරීමයි. සාමාජික ආයතනයක් ලෙස ආසියතු විද්‍යා කවුන්සිලයට සම්බන්ධ වන ලෙස ඔවුන් කොමිෂමට ආරාධනා කලේය. ජූලි මස 4-6 දිනයන්හි මොන්ගෝලියාවේ පැවති ආසියාතු විද්‍යා කවුන්සිලයේ 11 වන සමුළුවට නිරික්ෂකයින් ලෙස සහභාගි වන ලෙසද ඔවුහු ආරාධනා කල අතර එමගින් කවුන්සිලයට සම්බන්ධ වීම ශ්‍රී ලංකාවට වාසි දායක ද යන්න කොමිෂමට තිරණය කලහැකිව තිබුනි. කෙසේවෙතත් නොවැලැක්විය හැකි හේතුවක් නිසා මොන්ගෝලියාවේ පැවති සමුළුව සඳහා කොමිෂමට සහභාගී විය නොහැකි විය.

සාමාජික රටවල් සඳහා ලැබෙන ප්‍රධාන වාසි නම්, දැණුම හුවමාරු කර ගැනීම සහ පර්යේෂණ සහයෝගීතාවයන් ආරම්භ කිරීම සඳහා වේදිකාවක් තනා දීම සහ විද්‍යාඥයින් අතර සබඳතා ගොඩ නැගීමයි. ජපානය, චීනය, ඉංදියාව,මැලේසියාව වැනි රටවල් මේ වනවිටත් මෙම කවුන්සලයේ සාමාජිකයන් වේ.

වෙනත් කාර්යක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි අතරතුර ජපාන විද්‍යා කවුන්සලයේ සාමාජිකයෝ දෙදෙනෙකු 2011 සැප්තැම්බර් මස 09 වනදා නැවතත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවට පැමිණියහ.ශ්‍රී ලංකාව තුළ ප්‍රතිපත්ති විශ්ලේෂණ ක්ෂේත්‍රයේ කුසලතා සංවර්ධනය සඳහා ජපාන අනුග්‍රහය ලබා ගැනීමේ හැකියාව පිළිබඳව මෙම රැස්වීමේදී සාකච්ඡා කරන ලදී. ජපානය තුළ ඒ සඳහා ඇති ඉඩකඩ සොයා බැලීමට සාමාජිකයෝ එක-වූහ.

## තාක්ෂණ නාමාවලිය

නිශ්පාදන, ක්‍රියාවලි හා සේවාවන් හවුල් ව්‍යවසායකයින්ට හඳුන්වා දීම/අලෙවි කිරීම සඳහා වූ තාක්ෂණික වෙළඳපොළ ප්‍රදර්ශණයක් තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශය විසින් 2011 වර්ෂයේ ඔක්තොම්බර් මස 24 සිට 25 දක්වා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත් වූ අතර එහිදී බෙදා හැරීම සඳහා තාක්ෂණ නාමාවලියක් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් සම්පාදනය කරන ලදී.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන පර්යේෂණ ආයතන මගින් සංවර්ධනය කල නිශ්පාදන හා ක්‍රියාවලි පිළිබඳව මෙම නාමාවලිය මගින් තොරතුරු සපයනු ලැබේ. මෙම ආයතන වලින් සපයන විවිධ සේවාවන් පිළිබඳවද මෙම නාමවලිය මගින් තවදුරටත් තොරතුරු සපයයි.

## දැයට කිරුළ ප්‍රදර්ශණයට සහභාගී වීම

2011 වසරේ පෙබරවාරි මස 4 -10 දක්වා වූ දිනයන්හිදී බුත්තල පැවති, දැයට කිරුළ ප්‍රදර්ශණයට සහභාගී වන ලෙස ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවටද ආරාධනා කොට තිබිණි. ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තියේ දක්වා ඇති ප්‍රතිපත්ති අභිමතාර්ත දැක්වෙන පෝස්ටරයක් කොමිෂන් සභාව විසින් මෙම ප්‍රදර්ශණය සඳහා ඉදිරිපත් කරන ලද අතර එය තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශයේ ප්‍රධාන කුටියේ ප්‍රදර්ශණය කෙරුනි.

## ජාත්‍යන්තර සබඳතා

- **බහුඅංශයික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය සඳහා වන බෙන්ගාල බොක්ක මූලාරම්භය (BIMSTEC)**




## බිම්ස්ටෙක් තාක්ෂණික හුවමාරු පහසුකම:

බිම්ස්ටෙක් තාක්ෂණ හුවමාරු පහසුකම පිහිටුවීම පිලිබඳ වන 2 වන විශේෂඥ අධ්‍යයන කණ්ඩායම් රැස්වීම 2011 වර්ෂයේ මැයි මස 9-10 යන දෙදින තුලදී කොළඹ සිනමන් ලේක්සයිඩ් හෝටලයේදී පැවැත්විනි. විදේශ කටයුතු අමාත්‍යංශය, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශය හා එක්ව මෙය සංවිධානය කරන ලද අතර ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විශේෂඥ පහසුකම් සලසා දුන්නේය. බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මියන්මාර්, නේපාලය, තායිලන්තය සහ ශ්‍රී ලංකාව යන රටවල නියෝජිතයන් මෙම රැස්වීමට සහභාගී වූහ. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සභාපතිනි මහාචාර්ය නාලිනී රත්නසිරි මහත්මිය මෙම රැස්වීමේ මුලසුන දැරුවාය.

මෙම රැස්වීමේදී ශ්‍රී ලංකාව සංශෝධිත සංකල්ප පත්‍රිකාව ඉදිරිපත් කල අතර එය සාකච්ඡාකොට අවසානයකට ගෙන එන ලදී. ප්‍රධාන තාක්ෂණ හුවමාරුව, NERD මධ්‍යස්ථානයේ ස්ථාපනය කිරීමට නියෝජිතයෝ එක-වූහ. මෙම පහසුකමේ ප්‍රධාන අරමුණු වන්නේ;

1. බිම්ස්ටෙක් සාමාජික රටවල් අතර තාක්ෂණ පදනම්, තාක්ෂණ හුවමාරු තුලින් වැඩි දියුණු කිරීම
2. තාක්ෂණය හා සම්බන්ධ දැනුම බෙදාහදා ගැනීම සහ ඒවා පවරා දීම

මෙම පහසුකමේ අරමුදල් සැපයීමේ යාන්ත්‍රණය, මෙහෙයුම් අංශය සහ නීතිමය රාමුව පිළිබඳවද මෙම රැස්වීමේදී සාකච්ඡාවට භාජනය විය. දායක ගාස්තු, සාමාජික රට වලින් ලැබෙන ප්‍රතිපාදන සහ පරිත්‍යාග මෙම පහසුකමට අරමුදල් සැපයෙන ප්‍රධාන ප්‍රභවයන්ය. සාමාජික රට වල කේන්ද්‍රස්ථාන සහ ශ්‍රී ලංකාවේ ප්‍රධාන මධ්‍යස්ථානය හරහා මෙම පහසුකම ක්‍රියාත්මක වනු ඇත.

- ## නොබැඳි ජාතීන්ගේ සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (NAM S&T Centre)

1993 වර්ෂයේදී ලද කැබිනට් අනුමැතිය කට අනුව 1995 වර්ෂයේදී ශ්‍රී ලංකාව නොබැඳි ජාතීන්ගේ විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය හා සම්බන්ධ විය. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යංශය විදේශ කටයුතු අමාත්‍යංශයෙහි එකඟත්වය ඇතිව නාම් විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ ශ්‍රී ලංකාවේ කේන්ද්‍රස්ථානය ලෙස 2001 වර්ෂයේදී ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව නම් කරන ලදී.

කෘෂිකර්ම හා ඉලෙක්ට්‍රෝනික කර්මාන්ත ආදියෙහි නවතම තාක්ෂණයන් පිළිබඳ දැණුම ලබාගැනීම සඳහා නාම් විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය ශ්‍රී ලාංකීය විද්‍යාඥයින්ට අද්විතීය අවස්ථාවක් සලසා දුන් අතර දේශීය විද්‍යාඥයින්ට වෙනත් රටවල විද්‍යාඥයින් සමඟ අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් සඳහා අවස්ථා සලසා දී තිබුණි. නාම් විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය එහි විවිධ රටවල කේන්ද්‍රස්ථාන හා එක්ව අනුග්‍රහය දක්වන ක්‍රියාකාරකම් සඳහා සහභාගි වීමට විදේශ ගතවන ශ්‍රී ලාංකීය විද්‍යාඥයන්ට ගුවන් ගාස්තු හා හෝටල් පහසුකම් සලසා දෙයි. ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ ලබාදුන් නාම් විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය මගින් 2011 දී සිදු කරන ලද ක්‍රියාකාරකම් තුනක ලැයිස්තුවක් පහත දක්වා ඇත.

1. "විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති සහ තිරසාර සංවර්ධනය" පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව ඉරානයේ ටෙහෙරාන් නුවරදී ජනවාරි මස 5-7 යන දිනයන් හිදී පැවැත්විනි. මෙහිදී කොමිෂමේ සභාපතිනි මහාචාර්ය නාලිනී රත්නසිරි මහත්මිය විසින් ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී.

2. නර්ඩ් මධ්‍යස්ථානයේ ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු කේ.ට්. ජයසිංහ මහතා දියුණු වෙමින් පවතින රටවල බලශක්ති වෘත්තිකයන් සඳහා වූ බලශක්ති විගණනය නම් ජාත්‍යන්තර වැඩමුළුවට සහභාගී විය. මෙය ඉන්දියාවේ මුම්බායි හිදී 2011 මැයි 4 සිට 14 දක්වා පවත්වන ලදී.

3. කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ඉලෙක්ට්‍රෝනික් ඉංජිනේරු නුවන් කුමාරසිංහ මහතා 2011 ඔක්තෝබර් 12-14 යන දිනයන් හිදී නේපාලයේ කත්මන්ඩු නුවර පැවති අකුණු ආරක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී විය.



විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පිලිබඳ ජාත්‍යන්තර වැඩමුළුවට සහභාගී වූවන් අතර ශ්‍රී ලංකා නියෝජිතවරිය මහාචාර්ය නාලිනී රත්නසිරි ( පළමු පෙල වම් පස තෙවන ස්ථානයේ)

# අපගේ කාර්ය මණ්ඩලය

## ♦ විධායක කාර්ය මණ්ඩලය

**වැඩ බලන අධ්‍යක්ෂ**

ආචාර්ය මුදිත ලියනගෙදර.
B.Sc.,M.Phil (පේරාදෙණිය),
Ph.D (සෝල්)

**විද්‍යා වැඩසටහන් කළමනාකරුවන්**

ආශා පිටදෙණිය මෙනෙවිය.
B.Sc. M.Sc (පේරාදෙණිය)

**ගණකාධිකාරිණී**

ජී.සී.කේ. පීරිස් මිය.
B.Com (ශ්‍රී ජයවර්ධනපුර)

**විධායක ලේකම්**

රුක්මන් කුරේ බුලත්සිංහල මයා.

## ♦ සහකාර කාර්ය මණ්ඩලය

**වැඩසටහන් සහකාර**

**පරිසනක යෙදවුම්**

එල්.ඒ.එල්.එන්. ලියනආරච්චි මිය
B.Sc (සබරගමුව)

**මුදල්**

ආර්.එම්. තුසිත රත්නායක මයා.
M.A.A.T.

**පර්යේෂණ සහකාරවරියන්**

ධනංජලී පෙරේරා මෙනෙවිය
B.Sc. (පේරාදෙණිය)

අමාලි ජයතිලක මෙනෙවිය
B.Sc. (සබරගමුව)

**පෞද්ගලික සහකාර වරියන්**

නිල්මිණී පෙරේරා මිය
සයුමි විජේසිංහ මෙනෙවිය (කොන්ත්‍රාත් පදනම මත)

**පිළිගැනීමේ නිළධාරීණිය/ දුරකථන ක්‍රියාකාරිණිය**

දක්මිණී කරුණාතිලක මිය.

**රියදුරන්**

එච්.ඒ. අනිල් කුමාර හෙට්ටිආරච්චි මයා.
අයි.ජී. ජයශාන්ත ප්‍රභාත් මයා
එරන්ද ප්‍රදීප් මයා

**කාර්යාල කාර්යය සහායකයින්**

ඒ.ඩී ධනපාල මයා.
නිශාන්ත පියදාස මයා

# කාර්යය මණ්ඩල පුවත්

1. 2011 වර්ෂයේදී ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව පර්යේෂණ සහකාරවරියන් දෙදෙනෙකු (තාවකාලික පදනමින් ), එනම් ධනංජලී පෙරේරා මෙනෙවිය (පේරාදෙණිය විශ්ව විද්‍යාලය) සහ අමාලි ජයතිලක මෙනෙවිය (සබරගමුව විශ්ව විද්‍යාලය ) බඳවා ගත්තේය.

2. පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා යොමු කරමින් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව එහි සේවකයන්ගේ දැණුම වර්ධනය කිරීම සඳහා අවස්ථා ලබාදුන්නේය.

## ✓ පුහුණු වැඩසටහන්/ වැඩමුළු /සම්මන්ත්‍රණ

- ජාතික කම්කරු අධ්‍යයන ආයතනය විසින් ජනවාරි මස 31 දින සංවිධානය කරන ලද අන්තර් පුද්ගල සම්බන්ධතා සහ මහජන සම්බන්ධතා පිලිබඳ වැඩමුළුව සඳහා පිළිගැනීමේ නිළධාරිණී දක්ෂිණී කරුණාතිලක මහත්මිය සහභාගී වූවාය.

- මාර්තු මස 16 සහ 18 යන දින වලදී වෘත්තියවේදී සංගම් ආයතනය විසින් පවත් වනු ලැබූ කළමනාකරුවන් සහ පර්යේෂකයන් සඳහා වූ මූලික සංඛ්‍යානය සහ දත්ත විශ්ලේෂණය නම් වූ වැඩමුළුවට විද්‍යා වැඩසටහන් කළමනාකාරිණී ආශා පිටදෙනිය මෙනෙවිය සහභාගී වූවාය.

- නවීන තාක්ෂණය පිලිබඳ ආතර් සී.ක්ලාක් මධ්‍යස්ථානය විසින් අගෝස්තු මස 13 සහ 14 යන දින වලදී සංවිධානය කරන ලද වෘත්තිකයින් සඳහා පරිගණක දෘඩාකාංග අත්‍යාවශ්‍යතා නම් වූ වැඩමුළුව සඳහා කාර්යාල කාර්යය සහායක නිශාන්ත පියදාස මහතා සහභාගී වූයේය.

- ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් ඔක්තෝබර් 04 දින සංවිධානය කරන ලද වෘත්තීය භාවය පිළිබඳ වැඩමුළුවට සහභාගී වීම සඳහා වැඩසටහන් සහායක තුසිත රත්නායක මහතා සහ පෞද්ගලික සහායක නිල්මිණී පෙරේරා මහත්මිය තෝරා ගන්නා ලදී.

- කුසලතා සංවර්ධන අරමුදල මගින් මෙහෙය වන ලද ආරක්ෂාකාරීව රිය පැදවීම පිලිබඳ වැඩමුළුවක් සඳහා ඔක්තෝබර් 08 දින, අනිල් කුමාර, අයි.ජී.ජේ. ප්‍රභාත් සහ එරන්ද ප්‍රදීප් යන මහත්වරු සහභාගී වූහ.
- ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් දෙසැම්බර් 05 දින සංවිධානය කරන ලද සාධනීය සංයුක්ත සැලසුම්කරනය නම් වූ වැඩමුළුව සඳහා ආචාර්ය මුදිත ලියනගෙදර මහතා සහභාගී වූයේය.

- කුසලතා සංවර්ධන අරමුදල විසින් දෙසැම්බර් 08 දින සංවිධානය කරන ලද කළමනාකරණ සහකාරවරුන් සංවර්ධනය කිරීම පිළිබඳ වැඩමුළුව සඳහා දක්ෂිණී කරුණාතිලක මහත්මිය සහභාගී වූවාය.

## ✓ වෙනත් වැඩමුළු/ සම්මන්ත්‍රණ

- කාළගුණ විපර්යාස වලට අනුවර්තනය වීම සඳහා තාක්ෂණයන් හඳුනා ගැනීම සහ ප්‍රමුඛතාකරණය නම් වූ වැඩමුළුව සඳහා අශා පිටදෙනිය මෙනෙවිය සහභාගී වූවාය. මෙම වැඩමුළුව පරිසර අමාත්‍යංශය විසින් ඔක්තෝම්බර් මස 17-24 දක්වා පවත්වන ලදී.

- ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කරන ලද ජාතික නව්‍යකරන පද්ධති, ඒවයේ මෙහෙයුම් උපාය මාර්ග සහ කළමනාකරණ අංශ පිළිබඳ වැඩමුළුව සඳහා නස්ටෙක් ආයතනය නියෝජනය කිරීම සඳහා අශා පිටදෙනිය මෙනෙවිය පත් කරන ලදී. මෙම වැඩමුළුව නොවැම්බර් මස 2 සහ 3 යන දිනයන් හිදී පැවැත්විනි.

- ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් ජූලි මස 28,29 යන දෙදින තුල පවත්වන ලද තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී කාන්තා සහභාගීත්වය වර්ධනය කිරීම පිළිබඳ වැඩමුළුවට අගා පිටදෙනිය මෙනවිය සහ විධායක ලේකම් රුක්මන් කුරේ මහතා සහභාගී වූහ.

## ස්ථාවර වත්කම් මිලදී ගැනීම්

1. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ දිගුකාලීන අඛණ්ඩ ඉල්ලීමක ප්‍රතිඵලයක් ලෙස ආසන 15කින් සමන්විත නව වෑන් රථයක් ලිසිං පදනම යටතේ රජයෙන් ලැබුණි.
2. නස්ටෙක් ආයතනය 2011 වර්ෂයේදී පහත සඳහන් ස්ථාවර වත්කම් මිලදී ගත්තේය.

ජංගම පරිගණක මතකයන්
(Flash Drives)
දුරකථන
(Telephone)
ඡායා පිටපත් යන්ත්‍රයක්
(Photocopiers)
බහු මාධ්‍ය ප්‍රක්ෂේපකයක්
(Multimedia Projector)
පොත් රාක්ක
(Book Racks)

මයික්‍රොසොෆ්ට් ඔෆිස් මෘදුකාංගය.
(Microsoft Office Software)
වායු සමීකරණ යන්ත්‍ර
(Air Conditioners)
ජංගම පරිගණක
(Laptop Computers)
අනවරථ විදුලි සැපයුම් ඒකක
(UPS)

## මූල්‍යය ප්‍රකාශණය

### ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂම
### 2011 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | ලැයිස්තුව | 2011 | 2011 | 2010 | 2010 |
|---|---|---|---|---|---|
| වත්කම් | | Rs. | Rs. | Rs. | Rs. |
| ජංගම නොවන වත්කම් | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 1 | 12,050,084 | | 4,267,020 | |
| | | | **12,050,084** | | **4,267,020** |
| ජංගම වත්කම් | | | | | |
| ඉන්වෙන්ටරි/තොග | 2 | 149,907 | | 149,484 | |
| ලැබිය යුතු වෙළඳ සහ අනෙකුත් දෑ | 3 | 12,000 | | 12,000 | |
| කලින් ගෙවීම් | 4 | 421,355 | | 418,459 | |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 5 | 242,574 | | 897,548 | |
| සේවක ණය | 6 | 619,829 | **1,445,665** | 471,423 | **1,948,914** |
| **මුළු වත්කම්** | | | **13,495,749** | | **6,215,934** |
| වගකීම් | | | | | |
| ජංගම වගකීම් | | | | | |
| උපචිත වියදම් | 7 | 168,258 | | 163,828 | |
| | | | **168,258** | | **163,828** |
| ජංගම නොවන වගකීම් | | | | | |
| විලම්බිත ආදායම් | | 9,503,753 | | 439,500 | |
| පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් | 8 | 1,399,562 | **10,903,315** | 1,131,155 | **1,570,655** |
| **මුළු වගකීම්** | | | **11,071,573** | | **1,734,483** |
| මුළු ශුද්ධ වත්කම් | | | **2,424,176** | | **4,481,451** |
| ශුද්ධ වත්කම්/ ස්කන්ධය | | | | | |
| සමුච්චිත අරමුදල | | 6,694,282 | | 7,943,493 | |
| සංචිත | | (4,270,106) | | (3,462,042) | |
| **මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධය** | | | **2,424,176** | | **4,481,451** |

## ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂම

## 2010 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන වාර්තාව

| | | 2011 | 2010 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | **Rs.** | **Rs.** |
| පුනරාවර්ථන ප්‍රදාන | | 12,662,000 | 13,325,000 |
| ප්‍රාග්ධන ප්‍රදාන - විද්‍යා හා තාක්ෂණ සේවා | | 876,600 | 3,673,000 |
| රාජ්‍ය ප්‍රදාන ක්ෂය වීම් හිලව් කිරීම | | 1,380,957 | 1,555,742 |
| ආදායම් | **9** | 161,623 | 27,202 |
| | | **15,081,180** | **18,580,944** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පෞද්ගලික වේතන | **10** | 6,887,957 | 6,531,511 |
| සංචාර | **11** | 218,576 | 127,568 |
| සැපයුම් සහ භාවිතා කළ පාරිභෝජ්‍ය | **12** | 251,271 | 228,082 |
| නඩත්තු කිරීම් | **13** | 574,130 | 352,037 |
| ගිවිසුම් ගත සේවා | **14** | 4,125,321 | 4,720,336 |
| පැවරීම් | **15** | 1,380,927 | 922,067 |
| විද්‍යා හා තාක්ෂණ සේවා | **16** | 1,080,676 | 3,371,986 |
| ක්ෂය වීම් සහ ණය හිලව් වියදම් | **1** | 1,380,957 | 1,555,742 |
| මුළු මෙහෙයුම් වියදම් | | **15,899,815** | **17,809,329** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද අතිරික්තය/(ඌනනය) | | (818,635) | 771,615 |

| | | |
|---|---|---|
| **මූල්‍ය පිරිවැය** | | |
| දේපළ පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලැබීම් | 10,570 | 4,929 |
| මෙහෙයුම් නොවන මුළු ආදායම (වියදම්) | - | - |
| අදාල කාලය සඳහා ශුද්ධ අතිරික්තය/(ඌනනය) | (808,065) | 776,544 |

# විගණකාධිපති වාර්තාව

## විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / துலைவா / My No : ඊඑල්/ඊ/ එන්ඒඑස්ටීඊසෝ/ එෆ්ඒ/2011 | ඔබේ අංකය / உமது இல / Your No. : | දිනය / திகதி / Date : 2012 ජූලි 20 දින. |

සභාපති,
ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනතේ vii කොටසේ 40(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2012 අප්‍රේල් 19 දින නිකුත් කරන ලදී.

1.2 **<u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම</u>**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම හා වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමණාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමණාකරණයේ වගකීම වේ.

1.3 **<u>විගණකගේ වගකීම</u>**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී.ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිතිය අපේක්ෂා කරයි.

---

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone : 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. : 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ மெயில் / E-mail. : oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම් වලට උපකාර් වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත්වේ.විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තිරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර් බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

3

2.2 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

2.2.1 <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | |
|---|---|
| (අ) ගිණුම්කරණ ප්‍රමිත අංක 3 | ස්කන්ධයේ සියළු වෙනස්වීම් පෙන්වන ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි. |
| (ආ) ගිණුම්කරණ ප්‍රමිත අංක 16 | සමාලෝචිත වර්ෂය අවසානයේදී පාරිතෝෂිත ගෙවීම සඳහා රු.268,407 ක් වූ ප්‍රතිපාදනයක් කර තිබුණද, එම ප්‍රතිපාදන ආයෝජනය කර නොතිබුණු අතර ඒ බව මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කර නොතිබුණි. |
| (ඇ) ගිණුම්කරණ ප්‍රමිත අංක 18 | සමාලෝචිත වර්ෂයෙහි මිලදී ගත් රු.9,172,481 ක ස්ථාවර වත්කම් ක්ෂය කර නොතිබුණි. |

2.2.2 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ | |
| 8 (i) වගන්තිය | මුදල් වර්ෂය ආරම්භ වී මාස 3 ක් ඉක්මයාමට පෙර අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අයවැය ලේඛණය සම්මත කරගත යුතු වුවද, මෙම වාර්තාවේ දිනය දක්වාම සම්මත කරගෙන නොතිබුණි. |
| 14 (1) වගන්තිය | ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුලත කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි - අංක 135 | මනා අභ්‍යන්තර පාලනයක් ඇති කිරීම සඳහා අභ්‍යන්තර පරීක්ෂාවක් සිදු වන පරිදි නිලධාරීන් දෙනුන් දෙනෙකුගේ අතරේ පරීක්ෂණයට භාජනය වන පරිද්දෙන් හැකි සෑම අවස්ථාවකදීම රාජකාරී පැවරීම් කළයුතු වුවත් කොමිෂන් සභාවේ මාණ්ඩලික නිලධාරීන් 03 |

4

දෙනෙකු සිටියදී මූල්‍ය බලතල පැවරීම් නිලධාරීන් දෙදෙනකු අතරේ පමණක් සිදු කර තිබුණි.

(ඇ) චක්‍රලේඛ විධිවිධාන

----------------------

| | |
|---|---|
| (i) 2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 6:5:3 ඡේදය | කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසන් වී දින 150 ක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත් අවසන්වරට සභාගත කර තිබුණේ 2008 වර්ෂයේ වාර්ෂික වාර්තාව පමණකි. |
| 8.3.5 (ඇ) ඡේදය | සුදුසු වර්ගීකරණයක් යටතේ මිල ගණන කැඳවා අදාල සැපයුම්කරු සොයාගත යුතු වුවත් එම නියමයන්ට පටහැනිව වසර ගණනාවක සිට මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද රු.96,856 ක් වැය කරමින් එකම ආයතනයකින් පමණක් කුලී රථ සේවාව ලබා ගෙන තිබුණි. |
| 8.3.7 ඡේදය | අයවැය ලේඛණයේ සඳහන් නොවූ ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවද රු.506,640 ක් වටිනා වත්කම් මිලදී ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| 9.6 ඡේදය | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම සඳහා කාර්ය සාධන ඇගයීමක් ක්‍රියාත්මක කර නොතිබුණ අතර 2011 වර්ෂයට සියළුම නිලධාරීන් සඳහා වැටුප් වර්ධක ලබාදී තිබුණද වැටුප් වර්ධක පත්‍රිකා කිසිවක් පෞද්ගලික ලිපිගොනුවල ගොනුකර නොතිබුණි. |

5

2.2.3 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවන ගනුදෙනු

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කොමිෂන් සභාවේ නිලධාරීන් වෙත ආපදා ණය ලබාදීමේදී මු.රෙ. 135 ප්‍රකාරව නිර්දේශ කිරීමට බලතල ලබා නොදුන් තනතුරු නාමයකින්,තනතුරට අදාල නොවන අයෙකු විසින් අත්සන යොදා රු.282,004 ක ආපදා ණය මුදලක් චෙක්පත් වලින් ගෙවීම නොකර මුදලින් ගෙවීම් කර තිබුණි.

(ආ) විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම් සඳහා පර්යේෂණ සහකාරවරුන් දෙදෙනකු සමාලෝචිත වර්ෂයේ ජූනි මස සිට සේවයේ යොදවා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ විය.

- උක්ත නිලධාරීන් දෙදනාට මාසික ඉදිරි වැඩ සටහන් අනුමත කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුලදී දීමනා වශයෙන් රු.205,850 ගෙවීමක් සිදු කර තිබුණි.

- උක්ත නිලධාරීන් දෙදෙනාගේ කාර්ය සාධන වාර්තාවන් පරීක්ෂා කිරීමේදී එකම කාර්යය නිලධාරීන් දෙදෙනාම සිදුකර ඇති අවස්ථාද ආයතනයේ වෙනත් නිලධාරියකුගේ රාජකාරී ලැයිස්තුවට අදාල වූ කාර්යයන් ද ඉටුකර ඇති අවස්ථා නිරීක්ෂණය විය.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

---

3.1 මූල්‍ය ප්‍රතිඵලය

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය වූ රු.12,662,000 ක් ගණන් ගැනීමෙන් පසු සභාවේ වැඩ කටයුතු වලින් රු. 808,065 ක ඌනතාවයක් වූ අතර,ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් වූ රු.13,325,000 ක රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසු එම වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 776,544 ක අතිරික්තයක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,584,609 ක පිරිහීමක් දක්නට ලැබුණි.විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී ලද රජයේ ප්‍රදානය රු.2,279,400 කින් අඩුවීම මෙයට හේතුවිය.

6

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලසුමේ සඳහන් කර ඇති ඉලක්ක සපුරාගත නොහැකි වීම පිළිබඳව වූ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත ඇස්තමේතුගත පිරිවැය රු.මි.1.225 ක්වූ කාර්යයන් 04ක් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුලත් වූ ඇස්තමේන්තුගත පිරිවැය රු.මි.2.74ක් වූ කාර්යයන් 03 ක් සඳහා වර්ෂය තුළ වියදම් කර තිබූ ප්‍රමාණය රු.මි.0.8867 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී කොමිසම විසින් විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම් වෙනුවෙන් දරන ලද වියදම් පිළිබඳව වූ මූල්‍යමය කාර්ය සාධනය පහත පරිදි විය.

| (i) ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව පුරෝකථන වාර්ෂික වියදම | විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම් වෙනුවෙන් සත්‍ය වියදම | වියදම හා ඇස්තමේන්තුව අතර පරතරය | කාර්ය සාධනයේ ප්‍රතිශතය |
|---|---|---|---|
| රු.මි. | රු.මි. | රු.මි. | % |
| 4.165 | 0.887 | 3.278 | 21.29 |

(ii) වර්ෂ පහක කාලයක විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම් වෙනුවෙන් කොමිසමේ කාර්ය සාධනය පහත පරිදි විය.

| වර්ෂය | ඇස්තමේන්තුගත වියදම | සත්‍ය වියදම | වෙනස | කාර්යසාධන ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු . | % |
| 2011 | 4,165,000 | 887,267 | 3,277,731 | 21.30 |
| 2010 | 6,090,000 | 3,320,008 | 2,769,992 | 54.52 |
| 2009 | 3,145,000 | 990,286 | 2,154,714 | 31.48 |
| 2008 | 6,501,000 | 2,943,509 | 3,557,491 | 45.28 |
| 2007 | 2,800,000 | 1,632,428 | 1,167,572 | 58.30 |

7

(iii) ද්වි වාර්ෂික සමුළුව සඳහා පමණක් දරන ලද වියදමට අමතරව අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා කොමිසමේ කාර්යසාධනය මේ අනුව ඉතා පහල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

| වර්ෂය | ඇස්තමේන්තුව | සත්‍ය වියදම් | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| 2011 | 3,665,000 | 887,269 | 2,777,731 | 24.26 |
| 2010 | 3,090,000 | 778,505 | 2,311,495 | 25.19 |
| 2009 | 3,145,000 | 980,431 | 2,164,569 | 31.17 |
| 2008 | 3,546,000 | 948,046 | 2,597,954 | 26.74 |
| 2007 | 2,800,000 | 1,632,428 | 1,167,572 | 58.38 |

4.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වැඩ බැලීමේ තනතුරක් දීර්ඝ කාලයක් නොපුරවා තබා ගෙන සිටින අවස්ථාවලදී එම තනතුර තවදුරටත් තබාගැනීමේ අවශ්‍යතාවය අදාල අමාත්‍යාංශ ලේකම්වරයා විසින් විමසා බැලිය යුතුවේ. කෙසේවුවද 2010 අගෝස්තු 01 දින වැඩ බැලීමේ තනතුරක් සඳහා කොමිසමේ අධ්‍යක්ෂ ලෙස පත්වීම් ලද තනතුරුලාභියා එවැනි අවශ්‍යතාවයක් සම්පූර්ණ නොකර වර්ෂ 01 මාස 04 ක කාලයක් අඛණ්ඩ සේවයේ යොදවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී නොබැදි ජාතීන්ගේ විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය වෙත (නාම් මධ්‍යස්ථානය) 2011/2012 වාර්ෂික දායකත්වය වෙනුවෙන් රු.1,106,693 ක් ගෙවා තිබුණද 2011 වර්ෂයේදී එම දායකත්වය වෙනුවෙන් නිලධාරීන් 03 දෙනෙකු පමණක් සහභාගි වී තිබීමෙන් මේ රටේ විද්‍යාභිවර්ධනයට ප්‍රමාණවත් නොවන අයුරින් සීමිත ප්‍රතිලාභයක් ලබාදී තිබුණි.

නාම් මධ්‍යස්ථානයේ ශ්‍රී ලංකා කේන්ද්‍රිය මධ්‍යස්ථානය ලෙස 2001 වර්ෂයේ සිට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂම ක්‍රියාත්මක වන අතර මෙම කාලය තුළදී විවිධ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ සීමිත නිලධාරීන් පිරිස මෙරටට පැමිණි පසු තමන් ලද පුහුණුව තුලින් මෙරටේ විද්‍යාභිවර්ධනයට සිදු කරන ලද දායකත්වය පිළිබඳ පසු විපරම් සිදුකර නොතිබුණි.

8

4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

පෞද්ගලික ලිපිගොනු පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයතනයේ රියදුරු තනතුරු සඳහා අනුමත කාර්ය මණ්ඩලය 03 දෙනෙකු වූ අතර ආයතනය සතුව ඇති වාහන සංඛ්‍යාව 01 ක් විය. මේ අනුව අතිරික්ත රියදුරන් දෙදෙනා වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.323,040 ක වැටුපක් ගෙවීම් කර තිබුණි.

(ආ) ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් එම්ජ්-1-2-2006 වැටුප් කාණ්ඩය යටතේ 2003 වර්ෂයේදී බඳවා ගත් නිලධාරිනියකගේ වැටුප් සංශෝධනය කිරීමේදී ඇයට හිමි විය යුතු වැටුප් පියවරට වඩා වැටුප් පියවර 08 ක් ඉදිරියෙන් තබා වැටුප් සකස් කිරීම නිසා 2012 පෙබරවාරි 15 දින වන විට රු.300,126 ක මුදලක් වැටුප් වශයෙන් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(ඇ) කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 16 දෙනෙකු වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය නිලධාරීන් 13 දෙනෙකු විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 03 දෙනෙකුගේ පුරප්පාඩුවක් දක්නට ලැබුණි.

5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

5.1 අභ්‍යන්තර විගණනය

------------------------

කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයන් වෙන් වශයෙන් පිහිටුවා නොතිබුණ අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණනය සිදු කර තිබුණද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් එක් විගණන විමසුමක් පමණක් නිකුත් කර තිබුණි.

5.2 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

කොමිෂන් සභාව පිහිටුවා වසර 12 ක් ගත වී ඇතත් මෙතෙක් විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි.

5.3 අයවැය ලේඛනමය පාලනය

------------------------------

(අ) සමාලෝචිත වර්ෂය සඳහා කොමිසම විසින් සකස් කරන ලද මිලදී ගැනීමේ සැලැස්ම ප්‍රකාරව වර්ෂයේ ඇස්තමේන්තු ගත වියදම් රු.මි.1.33 ක් විය. මිලදී ගැනීමේ ඇස්තමේන්තුව තුළ සඳහන් නොවූ වත්කම් වර්ග 03 ක් මිලදී ගැනීම වෙනුවෙන් වර්ෂය තුළ දී රු.506,640 වැයකර තිබුණි.

9

6. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) පෞද්ගලික, ලිපිගොනු, යාවත්කාලීන කිරීම

(ආ) අභ්‍යන්තර විගණන වැඩසටහන් සකස් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම

(ඇ) සේවක පඩිනඩි

(ඈ) පැමිණීමේ හා නිවාඩු ලේඛනය

(ඉ) වැටුප් වර්ධක සටහන් පෞද්ගලික ලිපිගොනු වලට ගොනු නොකිරීම

(ඊ) මූ.රෙ. 135 යටතේ බලතල බෙදා හැරීම

(උ) ගිණුම්කරණය (ස්ථාවර වත්කම් ක්ෂය,ජර්නල් සටහන් පිළියෙල කිරීම යනාදිය )

(ඌ) බැංකු සැසඳුම් පිළියෙල කිරීම

එච්.ජේ.එස්. සමරවීර
විගණකාධිපති

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවට අදාල පිළිතුරු**

ඉහත වාර්තාව සම්බන්ධයෙන් මෙම ආයතනයේ පිළිතුරු පහත දැක්වේ.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

2.2.1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

(අ) ගිණුම්කරණ ප්‍රමිත අංක 3
ඉදිරියේදී ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශ වලට ඇතුලත් කිරීමට කොමිසම බලාපොරොත්තු වේ.

(ආ) ගිණුම්කරණ ප්‍රමිත අංක 16
කොමිසම ක්‍රියාත්මක වන්නේ මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන වර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් පමණි. එලෙස භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන ආයෝජනය කිරීමක් කොමිසම මේ දක්වා සිදුකර නොමැති අතර, යම් සේවකයෙකු ඉවත්වන අවස්ථාවේදී ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍ය අවස්ථාවේදීම ලබාදීම මහා භාණ්ඩාගාරයෙන් සිදු කරයි. මෙම විගණන විමසුම සම්බන්ධව තවදුරටත් මහා භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබාගැනීමට කොමිසම බලාපොරොත්තු වේ.

(ඇ) ගිණුම්කරණ ප්‍රමිත අංක 18
ඉදිරියේදී ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ප්‍රකාරව වත්කම් මිලදී ගත් වර්ෂයේ පටන් ක්ෂය කිරීමට කොමිසම පියවර ගනු ඇත.

**2.2.2. නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම**

(අ). 1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තිය

කොමිසමේ කෙටුම්පත් අයවැය මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීමට පෙර 2010 ඔක්තොම්බර් 21 වැනි දින පැවති රැස්වීමේදි කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන ඇත. ඉදිරියේදී මුදල් වර්ෂය ආරම්භ වී මාස 3ක් ඉක්මයාමට පෙර අයවැය කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය

මෙම ප්‍රමාදයට හේතුව අවශ්‍ය තරම් කාර්ය මණ්ඩලය නොමැති වීමත් පවතින කාර්ය මණ්ඩලයට වෙනත් අත්‍යවශ්‍ය කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට සිදු වීමත්ය.

(ආ) මුදල් රෙගුලාසි

අංක 135 - ඉදිරියේදී කොමිසමේ මාණ්ඩලික නිලධාරීන් තිදෙනා අතරේම බලතල පැවරීමට කොමිසම බලාපොරොත්තු වේ.

(ඇ). චක්‍රලේඛ විධිවිධාන

(i) 6.5.3 ජේදය

2011 අගෝස්තු මස 22 දින 2009 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු ගත කිරීම සඳහා අනුමැතිය ලබාගැනීමට තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය ට යවා ඇත. 2010 වාර්ෂික වාර්තාව ද 2012 මැයි 22 දින අවශ්‍ය කටයුතු සඳහා අමාත්‍යාංශයට යොමු කර ඇත.

8.3.5. (ඇ) ඡේදය

දිගු කලක සිට කොමිසමේ ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගන්නා ලද්දේ කැන්ගරු කුලීරථ සේවාව මගිනි. මුල් කාලයේ දී මිල ගණන් කැඳවා අදාල සැපයුම්කරු තෝරාගැනීම කල ද, වර්තමානයේදී එසේ නොකිරීමට හේතුවූයේ සාපෙක්ෂව බලන කල කැන්ගරු ආයතනයෙන් පිළිගත් කාර්යක්ෂම සේවාවක් ලැබීමයි.

8.3.7 ඡේදය

ඉදිරියේදී මෙවැනි මිලදීගැනීම් සඳහා විධිමත් පරිදි කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමට බලාපොරොත්තු වේ.

9.6. ඡේදය

වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම සඳහා සුදුසු ඇගයීමේ ක්‍රමවේදයක් මේ වන විටත් සකස් කර ඇති අතර, නව කොමිෂන් සභාව පත් කල වහාම එය අනුමත කරගෙන, ක්‍රියාත්මක කිරීමට කොමිසම බලාපොරොත්තු වේ. එසේම වැටුප් වර්ධක පත්‍රිකා සියළුම සේවකයන්ගේ පෞද්ගලික ලිපිගොනුවල ගොනුගත කිරීමටද කොමිසම කටයුතු කරනු ඇත.

**<u>2.2.3. ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවන ගනු දෙනු</u>**

(අ) මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව බලතල පැවරීම් ලිපියෙන් වවුචර් පත් නිර්දේශ කිරීමේ බලතල කොමිසමේ විධායක ලේකම් වෙත පවරා ඇත. එම නිලධාරියා නොමැති අවස්ථා වලදී පමණක් විද්‍යා වැඩසටහන් කළමණාකරුවෙකු ඔහු වෙනුවෙන් එම නිර්දේශ කිරීම් සිදු කරයි. ඒ අනුව නිර්දේශ කිරීම සිදු කර ඇත්තේ ඒ සඳහා ඉහත කී ලිපියෙන් බලතල ලැබූ නිලධාරියා විසිනි.

මෙලෙස මුදලින් ගෙවීමට සිදුවූයේ ආපදා ණය මුදල තැන්පත් කරනු ලබන්නේ ලංකා බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුමක නිසා ය.

(ආ)

- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් පර්යේෂණ සහකාරවරුන් බඳවා ගැනීමට යාවජීව අනුමැතියක් ලබාදී ඇති අතර, අවශ්‍යතාවය පරිදි කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව, මෙම පර්යේෂණ සහකාරවරුන් බඳවා ගැනීම සිදුවේ. සෑම වසරකම අයවැය ඇස්තමේන්තු සැකසීමේදී පර්යේෂණ සහකාරවරුන්ගේ දීමනා සඳහා ද ප්‍රතිපාදන ඉල්ලා සිටින අතර ඒ සඳහා ද භාණ්ඩාගාර අනුමැතිය හිමි වේ.
- මෙම පර්යේෂණ සහකාරවරුන් දෙදෙනා ගෙන් එක් අයෙකු බඳවා ගන්නා ලද්දේ වාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමාලෝචනයේ කටයුතු සඳහාය. අනෙක් පර්යේෂණ සහකාරවරිය බඳවා ගන්නා ලද්දේ කොමිසමේ කාර්ය මණ්ඩල හිඟතාවයට තාවකාලික පිළියමක් වශයෙන් විවිධ කාර්යයන් වලට සහාය ලබාගැනීම සඳහාය. පර්යේෂණ සහකාරවරුන් බඳවාගන්නේ නිශ්චිත කාර්යයන් සඳහා බැවින් මාසික ඉදිරි වැඩසටහන් අනුමත කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.
-
  I. කොමිසමේ ඇතැම් කාර්යයන් කාර්යක්ෂමව සහ කඩිනමින් ඉටුකරගැනීම සඳහා එකම කාර්යයේ කොටස් නිලධාරීන් කීප දෙනෙකු අතර බෙදා දෙන අවස්ථා (උදා.වාර්ෂික වාර්තා පරිවර්තන කටයුතු)
  II. එක් නිලධාරියෙකුට පැවරූ කාර්යයක් එම නිලධාරියාට වෙනත් කාර්යයන් පැවරීම සඳහා තවත් නිලධාරියෙකුට භාරදීමට සිදුවන අවස්ථා
  III. යම් හදිසි කාර්යයක් පැවරූ නිලධාරියෙකු එම කාර්යය සම්පූර්ණ නොකර හදිසියේ නිවාඩු ලබාගත් විට කාර්යයේ ප්‍රමුඛතාවය සලකා එම කාර්යයම වෙනත් නිලධාරියෙකුට පැවරීමට සිදුවන අවස්ථා සහ
  IV. රාජකාරියට අදාල නිළධාරියා වෙනත් රාජකාරියක යොදවා ඇති අවස්ථා වලදී මෙවැනි දෑ සිදුවේ. ඌණ කාර්ය මණ්ඩලයක් සහිත ආයතනයක මෙවැනි දෑ සිදුවීම සාමාන්‍ය දෙයකි.

**3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

3.1 vi වන ද්විවාර්ෂික සමුළුවේ පසු ක්‍රියාකාරකම් සඳහා විශේෂඥ උපදේශක කණ්ඩායමක සහය බලාපොරොත්තු වුවද කොමිෂම තුලම එය සිදු කෙරුනු බැවින් හා vii වන ද්විවාර්ෂික සමුළුව සඳහා තේමාව හඳුනා ගැනීම ස්ථිර වශයෙන්ම සිදු නොවුනු නිසා ඒ සඳහා මෙහෙයුම් කමිටුවක් පත් නොකෙරුනු බැවින්, ඒ සඳහා ඇස්තමේන්තු ගත කර තිබූ මුදල් වියදම් නොවිණි.

තවද කොමිෂම විසින් සමාලෝචිත වර්ෂය තුලදී විද්‍යා හා තාක්ෂණ ආයතන 5ක ප්‍රගතිය සමාලෝචනය කිරීමට සැලසුම් කර තිබුනද ස්වයං අධ්‍යන වාර්තා ලැබුනේ ආයතන 3 කින් පමණි. එම නිසා ආයතන 2 ක සමාලෝචනයන් සිදු කිරීමට නොහැකි විය.

**4.1 කාර්ය සාධනය**

අ, ආ සහ ඇ I, II, III යන නිරීක්ෂණයන්

කොමිසමේ ප්‍රධාන කාර්යයන් වනුයේ :

1. විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සම්පාදනය
2. විද්‍යා හා තාක්ෂණ සමාලෝචනය
   i. වාර්ෂික ජාතික විද්‍යා හා තාක්ෂණ සමාලෝචනය
   ii. විද්‍යා හා තාක්ෂණ ආයතන සමාලෝචනය
3. ද්වි වාර්ෂිකව ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සමුළුව පැවැත්වීම ය.

මෙම කාර්යයන් සිදු කිරීමේදී පහත සඳහන් හේතුන්ගේ සමුච්චිත හෝ ශුද්ධ ප්‍රතිඵලයක් ලෙස සිදුවූ ඇතැම් ප්‍රමාදවීම් නිසා අවසාන මූල්‍ය කාර්යසාධනය අඩු අගයක පවතී.

I. ඇස්තමේන්තු ගත කර තිබූ ප්‍රාග්ධන ප්‍රතිපාදන මහා භාණ්ඩාගරයෙන් ලබානොදීම. මේ හේතුවෙන් සැලසුම් කර තිබූ කාර්යයන් කල්දැමීමට සිදුවිය.

II. ආයතන සමාලෝචන සිදුකිරීමේදී සමාලොචනයට ලක්වන ආයතන වලින් ලබාදිය යුතු ස්වයං ඇගයීම් වාර්තා නිසි කලට ලබානොදීම සහ සමාලෝචන සඳහා සමාලෝචන මණ්ඩල සාමාජිකයින්ට සහ ආයතන වලට පහසු දින ලබාගැනීමේ අපහසුතාව

III. ප්‍රතිපත්ති සම්පාදන අධ්‍යයන කණ්ඩායම් සඳහා තෝරාගනු ලබන අදාල විශේෂඥතා ඇති පුද්ගලයන් ඉතා කාර්ය බහුල බැවින් අධ්‍යයන කණ්ඩායම් වැඩ වල සිදුවන ප්‍රමාදයන්

IV. ආයතනයේ වරින් වර ඇතිවන කාර්ය මණ්ඩල හිඟතාවයන් නිසා සිදුවන ප්‍රමාදවීම් උදා. 2007, 2011 වර්ෂ වල ඇතම් අවස්ථාවලදී ආයතනයේ අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩුව පැවතීම

V. ද්වි වාර්ෂික සමුළුව පැවැත්වෙන වර්ෂවලදී අනෙකුත් ප්‍රධාන කාර්යයන් සඳහා නිසි ප්‍රමුඛත්වයක් ලබාදීමට ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොසිටීම.

VI. විද්‍යා වැඩසටහන් කළමණාකරුවන්ට ඉහත දැක්වූ ප්‍රධාන කාර්යයන්ට ප්‍රමුඛතාව ලබාදෙනු වෙනුවට වෙනත් පරිපාලනමය කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට සිදුවීම. (උදා. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු, වාර්ෂික වාර්තා පිළියෙල කිරීම, බඳවාගැනීම් පරිපාටීම් සැකසීම, කාර්යයසාධන වාර්තා සැකසීම, විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම වැනි).

**4.2. කලමණාකරන අකාර්යක්ෂමතා**

(අ) නව අධ්‍යක්ෂවරයෙකු බඳවාගැනීම, නව බඳවාගැනීම් පරිපාටිය අනුමත කරගන්නා තුරු සිදුකර ගත නොහැකි විය.

එම පරිපාටියම් 2011.09.30 දින අනුමත වීමෙන් පසු 2011.11.12 දින එම තනතුර සඳහා අයදුම්පත් කැඳවන ලදි. එහිදී ඉල්ලා තිබූ සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් කිසිවක් නොලැබුනු හෙයින් එම තනතුර සඳහා යලි අයදුම්පත් කැඳවීමට කොමිෂන් සභාව තීරණය කරන ලදි.

එහෙත් කොමිෂන් සභාවේ නිල කාලය 2012.01.09 දින අවසන් වූ බැවින් එම කටයුත්ත කල් දමන ලදි.

(ආ) නාම් මධ්‍යස්ථානය මගින් සංවිධානය කරනු ලබන වැඩමුළුවලට එම මධ්‍යස්ථානයේ මූල්‍යමය අනුග්‍රහය ඇතිව සහභාගී වීමට නම් එහි වාර්ෂික දායක මුදල අනිවාර්යයෙන්ම ගෙවිය යුතුය.

වැඩමුළු සඳහා සහභාගී වන ශ්‍රී ලංකික නිලධාරීන්ගේ සංඛ්‍යාව රඳාපවතිනුයේ එම මධ්‍යස්ථානය වාර්ෂිකව සංවිධානය කරන වැඩමුළු සංඛ්‍යාව හා ඒවායේ ශ්‍රී ලංකාවට ඇති අදාලත්වය යන කරුණු මතය.

සහභාගීවන නිලධාරීන් ලබාගන්නා දැනුමට මූල්‍යමය වටිනාකමක් ලබාදීම අපහසු වුවද සහභාගී වන නිලධාරීන්ගේ ගුවන් ගමන්, නවාතැන්, ආහාර හා වෙනත් වියදම් පමණක් සැලකූ විටද ඒවායේ මූල්‍යමය වටිනාකම වාර්ෂික දායක මුදල් වලට වඩා වැඩිය (ඇතැම් වර්ෂ වලදී හැර). මෙවැනි වැඩමුළු සඳහා නිලධාරීන් බොහෝ ගණනක් සහභාගී කරවිය නොහැකි අතර සහභාගී වූ සීමිත නිලධාරීන් පිරිස ලබාගත් දැනුමෙන් රටේ විද්‍යාභිවර්ධනයට සිදුවන මෙහෙය ප්‍රමාණාත්මකව ගණනය කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය නොකොට ලැබෙන ප්‍රතිලාභය සීමිත යැයි කීම පිළිගත නොහැක. මන්ද යත් එය ලබාගන්නා දැනුමේ ප්‍රමාණය, එම දැනුම භාවිතා කරන ආකාරය සහ කාලයේ ශ්‍රිතයක් වන බැවිනි.

සහභාගී වන නිලධාරීන් ශ්‍රී ලංකාවට පැමිණි පසු ඔවුන් ලැබූ ප්‍රතිලාභ ඇතුලත් වාර්තාවක් කොමිසම මගින් ලබාගනී. මීට අමතරව වෙනත් ආයතන වල සේවය කරන එම නිලධාරීන්ගෙන් දිගුකාලීනව සිදුවන මෙහෙය පිළිබඳ පසුවිපරම් කිරීම අදාල ආයතනය සතු කාර්යයක් වන අතර, ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් ද අප සතුව නොමැත.

## 4.3. කාර්ය මණ්ඩල පරිපාලනය

(අ).i. කුලී පදනම මත ලබාගත් කාර් රථයක් සහ වෑන් රථයක් පිළිවෙලින් කොමිසමේ අධ්‍යක්ෂවරයාගේ වෙන්කල වාහනය ලෙස හා කොමිසමේ රාජකාරි කටයුතු සඳහා සංචිත වාහනය ලෙස භාවිතා කල ද, අයවැය චක්‍රලේඛ 150 අනුව 2010.03.05 දින වෑන් රථයද, 2010.10.12 දින කාර් රථය ද නැවත භාරදීමට පියවර ගන්නා ලදි.

ii. මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ 2011.07.20 දින මහා භාණ්ඩාගාරයෙන් වෑන් රථයක් හා කාරයක් ඉල්ලා සිටිය ද ඒවා කොමිසම ට ලැබුනේ පිළිවෙලින් 2011 නොවැම්බර් 30 වෙනි දින හා 2012 පෙබරවාරි 09 වැනි දිනයන් හි දීය.

iii. මෙලෙස කුලී පදනම මත ලබාගත් වාහන ඉහත (i) පරිදි ආපසු භාරදීමට සිදුවීමෙත් රජයෙන් ලබාදෙන වාහන ලබාදීමට ප්‍රමාදවීමෙත් අනිවාර්ය ප්‍රතිඵලයක් වශයෙන් එම රියදුරන් දෙදෙනාට ධාවනය සඳහා වාහන නොතිබුනි. එහෙත් ඔවුන් කොමිසමේ ස්ථිර සේවකයන් බැවින් වැටුප් ගෙවීම අනිවාර්ය කාරණයකි.

(ආ). නව බඳවාගැනීම් පරිපාටිය අනුව මෙය නිවැරදි කල යුතු ආකාරය මේ වන විට සකසා ඇති අතර, කොමිෂන් සභාව පත් කල වහාම ඒ සඳහා අනුමැතිය ලබාගැනීමට කොමිසම බලාපොරොත්තු වේ.

(ඇ) වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කර එවා ඇති අතර, නව කොමිෂන් සභාව පත් කල වහාම එහි අනුමැතිය ලබාගෙන මෙම පුරප්පාඩු පිරවීමට කොමිෂම පියවර ගනු ඇත.

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

5.1. අභ්‍යන්තර විගණනය

කොමිසම ඉතා සීමිත කාර්ය මණ්ඩලයකින් යුක්ත වන නිසා සහ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ එම අංශයෙන් සිදුකරන නිසා මේ දක්වා එවැනි ඒකකයක අවශ්‍යතාවයක් පැන නැඟී නොමැත. තවද, මෙම විගණන ප්‍රශ්නය සම්බන්ධයෙන් අමාත්‍යාංශය දැනුවත් කිරීමට කොමිසම බලාපොරොත්තු වේ.

5.2 .විගණන හා කළමනාකරණ කමිටු

කොමිසම මේ වන විට තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ පැවැත්වෙන විගණන හා කළමනාකරණ කමිටුවට සහභාගී වන අතර, නව කොමිෂන් සභාව පත් කල වහාම අනුමැතිය ලබාගෙන විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා ගැනීමට කොමිසම පියවර ගනු ඇත.

5.3. අය වැය ලේඛණමය පාලනය

(අ) කොමිසම සතුව පැවති අදාල වත්කම් (යන්ත්‍ර) තුනම අනපේක්ෂිත ලෙස දෝෂ සහිත හෝ ක්‍රියා විරහිත වූ බැවින් කොමිසමේ කටයුතු සඳහා මෙම යන්ත්‍ර වල අත්‍යාවශ්‍යතාවය සලකා 2011 වර්ෂයේ මිලදී ගැනීමේ සැලැස්මට පරිබාහිරව එම වත්කම් මිලදී ගැනීමට කොමිසමට සිදුවිය.

ස්තුතියි.

ආචාර්ය මුදිත ලියනගෙදර
වැ. බ. අධ්‍යක්ෂ

# සම්බන්ධිකරණ තොරතුරු

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව
223 සී, නාවල පාර,
නාරාහේන්පිට, කොළඹ 5
දුරකථන: 011-2807945, 2808947, 2807346
ෆැක්ස්. 011-2807347
Email : nastecsl@yahoo.com

| තනතුර | දිගුව | සම්බන්ධිකරන තොරතුරු |
|---|---|---|
| සභාපති | 201 | 2807341 |
| වැ.බ අධ්‍යක්ෂ | 207 | 2807342 |
| විද්‍යා වැඩසටහන් කළමනාකරු | 205 | 2807343 |
| ගණකාධිකාරී | 204 | 2807344 |
| විධායක ලේකම් | 220 | 2807345 |